www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජෙනරාල් ඝාතනය: සිවිල් යුද්ධයේ තවත් ලකුනක්

## Killing of Sri Lankan general: another sign of civil war

**කේ. රත්නායක විසිනි**
**2006 ජූනි 28**

සඳුදා ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ හමුදා අන දෙන නිලධාරියකු ඝාතනය කිරීම දිවයිනේ උත්සන්න වන සිවිල් යුද්ධයක් පවතින බව තව දුරටත් සනාථ කරයි. ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න කිරීම සම්බන්ධයෙන් දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට චෝදනා කිරීම පිනිස ආන්ඩුව මෙම සිද්ධිය ඩැහැ ගෙන ඇතත්, රට යලිත් මිලිටරි ගැටුමක් තුලට තල්ලු කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන දේශපාලනික වගකීම පැටවෙන්නේ කොලඹ ආන්ඩුව මත ය.

පැහැදිලිව ම මැනවින් සැලසුම් කරන ලද්දක් වන මෙම ඝාතනය සිදු කරන ලද්දේ මේජර් ජෙනරාල් පාරමී කුලතුංග ගමන් කරමින් සිටි වාහනය මතට සිය යතුරු පැදියෙන් කඩා වැදුනු මරාගෙන මැරෙන බෝම්බකරුවකු විසිනි. ජෙනරාල්, ඔහුගේ මිලිටරි සහායකයන් දෙදෙනෙක් සහ සිවිල් වැසියෙක් කොලඹ ජාතික රෝහලට ඇතුලු කරන විට මිය ගොස් සිටියේ ය. උදේ 7.45ට පමන කොලඹ සිට කිලෝ මීටර් 15ක් පමන ඊසාන දෙසින් පිහිටි පන්නිපිටියේ දී සිදු වූ මෙම ප්‍රහාරයෙන් තවත් හත් දෙනෙකුට පමන තුවාල සිදු විය.

කුලතුංග යුද හමුදාවේ නියෝජ්‍ය මාන්ඩලික ප්‍රධානි සහ එහි ධුරාවලිය තුල තෙවන නිලධාරියා විය. ඔහු උතුරු පලාතේ වන්නි ප්‍රදේශයේ සියලු ආරක්ෂක හමුදාවල අන දෙන නිලධාරියා විය. එල්ටීටීඊයේ මූලස්ථානය පිහිටියේ ද වන්නි ප්‍රදේශයේ වන අතර එහි භූමි ප්‍රදේශවලින් වැඩි කොටසක් පාලනය කරන්නේ එල්ටීටීඊය යි. කුලතුංග 2002 සටන් විරාමයට පෙර එල්ටීටීඊයට එරෙහි ප්‍රධාන මිලිටරි මෙහෙයුම් ගනනාවක් ම මෙහෙයවී ය.

ඔවුන් වගකීම භාර ගෙන නැති වුවත්, මෙම ප්‍රහාරය එල්ටීටීඊයේ වැඩක් බවට මුලුමනින් ම පාහේ නිශ්චිත ය. මරාගෙන මැරෙන බෝම්බකරුවන් දිගු කලක් තිස්සේ එල්ටීටීඊයේ ආවේනික ලක්ෂනයක් වී තිබේ. අප්‍රේල් අග දී, කොලඹ නගර මධ්‍යයේ දැඩි මුරකාවල් යටතේ පවත්නා යුද හමුදා මූලස්ථානයේ දී හොඳින් සැලසුම් කරන ලද තවත් මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකාගේ ජීවිතය ගැලවුනේ යන්තමිනි. බහුතරයක් මිලිටරි භටයන් ඇතුලු තවත් දහ දෙනෙක් එහි දී ඝාතනයට ලක් විය.

*නිව් යෝර්ක් ටයිම්ස්* හි වාර්තා කෙරුනු අදහස් දැක්වීමක දී, එල්ටීටීඊ ප්‍රකාශක දයා මාස්ටර්, එල්ටීටීඊයට වහාම චෝදනා කිරීම ගැන ආන්ඩුව විවේචනය කලේ ය. එහෙත් ඔහු ප්‍රහාරය සම්බන්ධයෙන් එල්ටීටීඊයේ වගකීම ප්‍රතික්ෂේප කලේ නැත. එල්ටීටීඊයට හිතැති *ටැමිල්නෙට්* වෙබ් අඩවියේ පල වූ ලිපියක් "වන්නියේ ජ්‍යෙෂ්ට එල්ටීටීඊ අන දෙන නිලධාරීන් ඉලක්ක කර ගත් ශ්‍රී ලංකා හමුදාවේ දිගු දුර ඒකකයේ ප්‍රහාරයන්ට ක්ෂනිකව ඉක්බිතිව" බෝම්බ ප්‍රහාරය සිදු වූ බව සටහන් කර ගත්තේ ය. මඩකලපුව හා මන්නාරම ප්‍රදේශවල සිය ජ්‍යෙෂ්ට අන දෙන නිලධාරීන් දෙදෙනෙකු ඝාතනය කිරීම ගැන ද එල්ටීටීඊය හමුදාවට චෝදනා කලේ ය.

කුලතුංග ඝාතනය හුදකලා සිද්ධියක් නොව, පසු ගිය නොවැම්බරයේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ තේරී පත් වීමෙන් පසුව දිග හැරුනු ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න වීමේ ක්‍රියාදාමයේ කොටසකි. තමන්ගේ කිසිදු සම්බන්ධයක් නැති බවට ඔවුන් පුරුද්දක් ලෙස කරන ප්‍රකාශ තිබිය දී ම, ශ්‍රී ලංකා මිලිටරිය ද එය සමග සහයෝගීව ක්‍රියා කරන දෙමල පැරා-මිලිටරි කන්ඩායම් ද එල්ටීටීඊ කේඩර හා ආධාරකරුවන් ඝාතනය කිරීම මගින් එල්ටීටීඊය ප්‍රකෝප කිරීමේ ක්‍රියාශීලීව නිරතව ඇති බවට සාක්ෂ්‍ය වැඩෙමින් පවතී. ඔස්ලෝ සාකච්ඡාවල දී 2002 සටන් විරාමය යලි තහවුරු කර ගැනීමට දැරුනු ප්‍රයත්නයන් බිඳ වැටීමෙන් පසුව, ඒ වන තෙක් බොහෝ සෙයින් අවෘත යුද්ධයක් ලෙස පැවති ගැටුම මෑත සති ගනනාව තුල දී වඩ වඩා විවෘත එකක් බවට පත් විය.

භීතියේ වාතාවරනය උත්සන්න කිරීමත් එල්ටීටීඊයට එරෙහිට යලි ප්‍රහාරයක් අරඹනු පිනිස සහයෝගය අවුස්සා ගැනීමත් සඳහා රාජපක්ෂ කුලතුංග ඝාතනය වහාම ගසා කෑවේ ය." මෙම ප්‍රචන්ඩ ක්‍රියාව . . . සිවිල් වැසියන් වත් ආරක්ෂක හමුදාවන් වත් බිය ගැන්වීමට

සමත් නොවනු ඇත. එල්ටීටීඊය හා එහි ත්‍රස්තවාදය පරාජය කිරීමේ කර්තව්‍යයෙන් කිසිවකු වලකාලීමට සමත් නොවනු ඇත." යැයි ඔහු ප්‍රකාශ කලේ ය. ඔහු තව දුරටත් මෙසේ කියා සිටියේ යː "මෙම ම්ලේච්ඡ ඝාතන ත්‍රස්තවාදී බලවේග හා ප්‍රජාතන්ත්‍රවාදයේ සතුරන් පරාජය කොට අප රටේ සාධාරන හා කල් පවත්නා සාමයක් උදා කර ගැනීම පිනිස ඉදිරියට යාමෙහි ලා අප සැමගේ ම අධිෂ්ඨානය තව දුරටත් ශක්තිමත් කල යුතු ය."

සිංහල ස්වෝත්තමවාදී ස්ථර අතර "සාධාරන" සාමයක් පිලිබඳ සැඳහුම වනාහි එල්ටීටීඊය සමග කිසිදු සම්මුතියක් හෝ එයට සහන දීමක් නොකල යුතු ය යන්න සඳහා වූ සංකේතාත්මක යෙදුමකි. රාජපක්ෂගේ ප්‍රධාන දේශපාලන සගයන් වී ඇත්තේ, ආන්ඩුව 2002 සටන් විරාමය ඉරා දමා එල්ටීටීඊයට එරෙහිව පූර්න-පරිමාන යුද්ධයක් දියත් කල යුතු යැයි ඉල්ලමින් සිටින සිංහල අන්තවාදී පක්ෂ දෙකක් වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය යි.

කුලතුංගගේ මරනය තව දුරටත් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර ගැනීම සඳහා කඩතුරාවක් ලෙස ද යොදා ගෙන තිබේ. සඳුදා රාජපක්ෂගේ සභාපතිත්වයෙන් පැවති ජාතික ආරක්ෂක මින්ඩලයේ රැස්වීමකින් පසුව, ආන්ඩුව කොලඹ හා උප නගර ප්‍රදේශවල දැඩි ආරක්ෂක පියවර පැනවී ය. නව ආරක්ෂක විධි විධාන ගැඹුරින් ම මහජන විරෝධයට ලක් වන බව ගැන දැනුවත්ව මිලිටරි ප්‍රකාශක මහජනතාවගෙන් ඉල්ලා සිටියේ ආරක්ෂක හමුදාවන් හැඳුනුම්පත් පරීක්ෂා කිරීමේ දී තමන්ගේ අයිතීන් උල්ලංඝනය වීම් ගැන පැමිනිලි නොකරන ලෙස යි.

2002 සටන් විරාමයෙන් පසුව ඉවත් කරන ලද මාර්ග බාධක සහ සෝදිසි ස්ථාන පසු ගිය මාස ගනනාව තුල අගනුවර පුරා හන්දිවල යලි පිහිටුවනු ලැබ ඇත. දූන් සිවිල් යුද්ධයේ කාල පරිච්ඡේදයේ දී මෙන් නොඉවසිය හැකි පරීක්ෂාවන්ට වාහන හා ජනතාව යටත් කෙරෙනු ඇත. දෙමල ජනතාව පොලිස් හා මිලිටරි භටයන්ගේ හිරිහැරයන්ට හා අපයෝජනයන්ට විශේෂයෙන් ම ඉලක්ක වනු ඇත. දහස් ගනන් දෙමල ජනයා අත් අඩංගුවට ගත් ජනවාරියේ දිනක අලුයම ක්‍රියාවට දැමූ වටලෑම මෙන් අගනුවර සෝදිසි හා වටලෑමේ මෙහෙයුම් සඳහා නව විධි විධාන මගින් මාවත සැකසෙනු ඇත.

## සටන් විරාමය නූලෙන්

තවමත් නිල වසයෙන් බල පැවැත්වෙන 2002 සටන් විරාම ගිවිසුම නූලෙන් එල්ලී පවතී. එම ගිවිසුමේ ක්‍රියාකාරිත්වය නිරීක්ෂනය කරන ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුවේ (එස්එල්එම්එම්) ආරක්ෂාව පිලිබඳව සාකච්ඡා කරනු පිනිස, ඊනියා සාම ක්‍රියාදාමයේ පහසුකම් සලසන්නා වන නෝර්වේ විසින් ජූනි 8-9 දිනවල ඔස්ලෝ නුවරට දෙපාර්ශ්වය ම කැඳවන ලදි. එකිනෙකාට එරෙහිව චෝදනා එල්ල කර ගැනීම් මධ්‍යයේ, නියෝජිත කන්ඩායම් දෙක සාකච්ඡා මේසයට එකට වාඩි වීමට වත් අපොහොසත් විය.

දැන් සටන් විරාම නිරීක්ෂක කමිටුවේ ක්‍රියාකලාපය පවා අවිනිශ්චිත ය. ස්කැන්ඩිනේවියානු සටන් විරාම නිරීක්ෂන කමිටුවේ සිටින යුරෝපා සංගමයේ සියලු සාමාජිකයන් අගෝස්තු මුල වන විට විස්ථාපනය කල යුතු යැයි එල්ටීටීඊය ඉල්ලා ඇත. පසු ගිය මාසයේ දී, වොෂිංටනයේ පීඩනය යටතේ, යුරෝපා සංගමය එල්ටීටීඊය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස ලැයිස්තු ගත කලේ ය. යුරෝපා සංගමයේ තීන්දුව තදින් විවේචනය කල එල්ටීටීඊය, යුරෝපා සංගමයේ නිරීක්ෂකයන් තව දුරටත් අපක්ෂපාතී ලෙස සැලකිය නොහැකි යැයි අවධාරනය කරයි. යුරෝපා සංගමයට අයත් නැති ස්කැන්ඩිනේවියානු රටවල් වන නෝර්වේ සහ අයිස්ලන්තය පෙන්නුම් කර ඇත්තේ, කමිටුවේ පුරප්පාඩු පිරවීමේ හැකියාවක් තමන්ට නැති බව යි.

තවත් බාධාවක් එකතු කරමින්, රාජපක්ෂ, එස්එල්එම්එම් ප්‍රධානියා ලෙස සිටින ස්වීඩන් ජාතික උල්ෆ් හෙන්රික්සන් නෝර්වේජියානු නියෝජිතයකුගෙන් විස්ථාපනය කිරීමට විරුද්ධත්වය පල කොට ඇත. මීට යන්තම් සති දෙකකට ඉහත දී, එස්එල්එම්එම් එල්ටීටීඊයට එරෙහි ප්‍රහාරවලට හමුදාව හවුල්වීම පිලිබඳ සාක්ෂ්‍ය සහිත වාර්තාවක් නිකුත් කිරීමෙන් පසුව, ආන්ඩුව හා එහි සාම ලේකම් කාර්යාලය, එස්එල්එම්එම් හා හෙන්රික්සන් එල්ටීටීඊයට පක්ෂපාති යැයි චෝදනා කරමින් ඔවුන්ට පහර ගැසී ය. ජවිපෙ හා හෙල උරුමය නැවත නැවතත්, නෝර්වේ හා සටන් විරාමය "කොටින්ට ගැති" යැයි හෙලා දකිමින් නෝර්වේ සාම ක්‍රියාදාමයේ පහසුකම් සපයන්නාගේ කර්තව්‍යයෙන් ඉවත් කරන ලෙස ඉල්ලා තිබේ.

"අපේ (ආන්ඩුවේ) අනුමැතියෙන් තොරව" සටන් විරාම නිරීක්ෂක කමිටුවට කිසිදු වෙනස්කමක් කල නොහැකි යැයි ආන්ඩුවේ සාම ලේකම් කාර්යාලයේ ප්‍රධානී පාලිත කොහන නෝර්වේට අනතුරු අඟවා ඇත. ආන්ඩුව ඒ ගැන සම්මුතියක් ඇති කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම සටන් විරාම ගිවිසුමට අවසන් පහර එල්ල කිරීමකට සම ය. රාජපක්ෂගේ ආස්ථානයට ප්‍රතිචාර දක්වමින්, එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක එස්.පී. තමිල්චෙල්වම් ඉරිදා අනතුරු ඇඟවූයේ "නෝර්වේ (සිය) නිරීක්ෂන ක්‍රියාකාරිත්වය අත්හිට වුව හොත් යුද්ධය නොවැලැක්විය හැකි" බවට යි.

ජවිපෙ හා හෙල උරුමය යුද්ධය සඳහා විවෘතව ම උද්ඝෝෂනය කරයි. කුලතුංගගේ ඝාතනයෙන් පසුව නිකුත් කෙරුනු ජවිපෙ ප්‍රකාශය "මිනීමරු කොටි ත්‍රස්තවාදය ශ්‍රී ලංකාවේ ජනතාව මුහුන දෙන ප්‍රධානම

අභියෝගයී ලෙස නම් කොට " සමස්ත ජාතියම මෙම ත්‍රස්තවාදී තර්ජනයට එරෙහිව පෙල ගැසිය යුතුී යැයි ඉල්ලා සිටියේ ය.

ඔවුන්ගේ " ත්‍රස්ත විරෝධී යුද්ධයේී කොටසක් ලෙස ඍජු මිලිටරි සහයෝගය දෙන ලෙස හෙල උරුමය බුෂ් ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. " ගත යුතු හොඳම ක්‍රියාමාර්ගය (ශ්‍රී ලංකාවේ) ත්‍රස්තවාදී මුලස්ථානය විනාශ කිරීම යි. එය ඇමරිකාවේ ආරක්ෂාව සඳහා මාවත සකසනු ඇත.ී යැයි එය ප්‍රකාශ කලේ ය. එල්ටීටීඊය තහනම් කරන ලෙස ද නඩු විභාගවලින් තොරව පුද්ගලයන් රඳවා ගැනීමේ පුලුල් බලතල ආරක්ෂක හමුදාවන්ට ලබා දෙන රටේ ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යලි පනවන ලෙස ද හෙල උරුමය ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය.

ඉන්දියානු විදේශ අමාත්‍යංශය, මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය හෙලා දක " අප දෙරටම ගොදුරු වී ඇති ත්‍රස්තවාදයට එරෙහි අපගේ පොදු අරගලයේ දීී ඉන්දියාව ශ්‍රී ලංකාවේ ජනතාව සමග එකට සිටින බව ද ප්‍රකශ කලේ ය. එම ප්‍රකාශකයා සාම සාකච්ඡා යලි අරඹන ලෙස ඉල්ලා සිටියත්, ඉන්දියානු ආන්ඩුව එදින ම නිවේදනය කලේ. තමන් ශ්‍රී ලංකා මිලිටරියට සූක්ෂ්ම රාඩාර් උපකරන ලබා දෙන බව යි.

විවෘතව යුද්ධය ඉල්ලා සිටියේ නැති වුවත්, ඉන්දියාව, එක්සත් ජනපදය මෙන් ම, මෑත මාස ගනනාව තුල දී, කොලඹ ආන්ඩුව සම්බන්ධයෙන් වඩා විවෘතව සහයෝගී වෙමින් එල්ටීටීඊය සම්බන්ධයෙන් වඩා සතුරු ආකල්පයක් ගෙන තිබේ. මෙම මාරුව, රට යලි යුද්ධය දෙසට තල්ලු කරමින් එල්ටීටීඊයට එරෙහිව වඩා ආක්‍රමනශීලී ආස්ථානයක් ගැනීම කරා රාජපක්ෂ ආන්ඩුව හා එහි ස්වෝත්තමවාදී සගයන් දිරිගැන්වීමෙහි ලා මූලික සාධකයක් වී තිබේ.

© www.wsws.org